කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය

# බුද්ධ ධර්මය

9 ශ්‍රේණිය

I කොටස

කාලය පැය: 2

* සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. බුදු දහමේ ඉගැන්වෙන මූලික ඉගැන්වීම් අතරට අයත් වන්නකි. ?

I. පන්සිල් II. ත්‍රිවිද්‍යා III. කර්මය IV. තෙරුවන්

02. කවර හෝ ආත්ම භාවයක දී විපාක දෙන කර්මය දහමේ හඳුන්වන්නේ ?

I. අහෝසි කර්ම ලෙසිනි II. අපරාපරිය වේදනීය කර්ම ලෙසිනි
III. දිට්ඨධම්ම වේදනීය කර්ම ලෙසිනි IV. උපජ්ජ වේදනීය කර්ම ලෙසිනි

03. රහතන් වහන්සේගේ ජීවිතය අවසන් වීම හඳුන්වන්නේ

I. ක්ලේශ පරිනිර්වාණය ලෙසිනි II. ස්කන්ධ පරිනිර්වාණය ලෙසිනි
III. ධාතු පරිනිර්වාණය ලෙසිනි IV. බුද්ධ පරිනිර්වාණය ලෙසිනි

04. සොබා දහමට බොහෝ සෙයින් ඇලුම් කළ බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේගේ පිරිනිවීම සඳහා තෝරා ගනු ලැබුවේ.

I. ලුම්බිණි සල් උයනයි. II. උපවත්තන සල් උයනයි.
III. කොසඹෑ නුවරයි IV. රජගහ නුවරයි.

05. බුදුරජාණන් වහන්සේගේ අන්තිම ශ්‍රාවකයා වූයේ?

I. කොණ්ඩඤ්ඤ හිමියන් ය II. මුගලන් හිමියන් ය
III. අනඳ හිමියන් ය IV. සුභද්ද හිමියන් ය

06. බුද්ධ චරිතයේ දක්නට ඇති නායකත්ව ලක්ෂණ අතුරින් සැරියුත්, මුගලන් දෙදෙනා වහන්සේට තනතුරු ප්‍රදානය කිරීමෙන් ප්‍රකට වූයේ?

I. යථාවාදී තථාකාරී ලක්ෂණයයි II. අනුගාමිකයන් ආරක්ෂා කරන ලක්ෂණයයි
III. සුදුසු පරිදි සුදුස්සන්ට වගකීම් පැවරීමේ ලක්ෂණයයි IV. නිවැරදි තීරණ ගැනීමේ ලක්ෂණයයි

07. බුදුරජාණන් වහන්සේ තම ශ්‍රාවක පිරිස ද පිරිවරාගෙන වෙහෙර දොරටුව දක්වා පසු ගමන් කරමින් ගෞරව කරන ලදී. එලෙසින් ගෞරවයට පාත්‍ර වූයේ?

I. පටාචාරා තෙරණියයි II. මහා ප්‍රජාපතී ගෝතමියයි
III. ඛේමා තෙරණියයි IV. උප්පලවන්නා තෙරණියයි

08. මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය පිරිනිවන් පාන ලද්දේ?

I. අවුරුදු අසූවෙන් ය II. අවුරුදු සීයෙන් ය
III. අවුරුදු එකසිය දහසයෙන් ය IV. අවුරුදු එකසිය විස්සෙන් ය

09. "චරන් චේ නාධි ගච්ඡෙය්‍ය" යන ගාථාවේ දෙවන පද පේළිය වන්නේ?

I. අත්ථාහි අත්තනෝ නත්ථි - කුතෝ පුත්තා කුතො ධනං යන්නයි
II. බාලෝච පණ්ඩිත මානී - භවේ බාලෝති වුච්චති යන්නයි
III. නසෝ ධම්මං විජානාති - දබ්බි සූපරසන් යථා යන්නයි
IV. ඒක චරියන් දල්හං කයිරා - නත්ථි බාලේ සහායතා යන්නයි

10. සිව්බඹ විහරණ අයත් වරණය වන්නේ ?

I. ජාති, ජරා, ව්‍යාධි, මරණ වේ.
II. දුක්ඛ, සමුද, නිරෝධ මාර්ග වේ.
III. මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා වේ.
IV. සෝවාන්, සකෘදාගාමී, අනාගාමී, අර්හත් වේ.

11. ලෝක පාලක ධර්මය යනු?

I. දානය හා සීලයයි
II. හිරි හා ඔත්තප්පයයි
III. පව හා පිනයි
IV. තණ්හාව හා තරහවයි

12. නිතර දානාදි ආමිසයෙන් සංග්‍රහ කරන ගිහිදායකයන් හට සිඟාලෝවාද සූත්‍රයේ සඳහන් පරිදි භික්ෂූන් වහන්සේ?

I. කරුණු 5කින් සංග්‍රහ කරයි.
II. කරුණු 6කින් සංග්‍රහ කරයි.
III. කරුණු 8කින් සංග්‍රහ කරයි.
IV. කරුණු 10කින් සංග්‍රහ කරයි.

13. මරණයට කැපවූ ගවයෙකු නිදහස් කර රැකබලා ගැනීමට ගාමිණී මහතා සමිත් ට බාරදුන්නේය? මෙම සත්ක්‍රියාව?

I. ධර්ම දානයට අයත් ය
II. ආමිස දානයට අයත් ය
III. අභය දානයට අයත් ය
IV. සාංඝික දානයට අයත් ය

14. සත්ව හිංසාවෙන් සහ ප්‍රාණ ඝාතනයෙන් වැළකීම සඳහා පුද්ගල සිත්තුළ පහළවන සිතුවිලි වනුයේ?

I. කරුණාව හා උපේක්ෂාවයි
II. කරුණාව හා මෛත්‍රියයි
III. මෛත්‍රිය හා මුදිතාවයි
IV. කරුණාව හා මුදිතාවයි

15. සිව්බඹ විහරණයන් අතුරින් මුදිතා ගුණයෙන් අදහස් වනුයේ

I. අනුන්ගේ දුක දැක තමන් ද දුක්වීමයි
II. අනුන් ගැන තමා මධ්‍යස්තව බැලීමයි
III. අනුන්ගේ දියුණුව දැක තමන් ද සතුටු වීමයි.
IV. අනුන්ගැන නොසිතා කටයුතු කිරීමයි

16. දස කුසල්වල දැක්වෙන පළමුවන කුසල කර්මය

I. නොදුන් දෙය ගැනීමෙන් වැළකීමයි
II. බොරුකීමෙන් වැළකීමයි
III. විකාල භෝජනයෙන් වැළකීමයි
IV. ප්‍රාණඝාතයෙන් වැළකීමයි

17. නිරෝගී බව උතුම් ලාභය වන බැව් බුදුරජාණන් වහන්සේ ධම්මපද ගාථාවකින් දේශනාකර ඇත. එම ගාථාවේ මුල්පද පේළිය ඇති වරණය තෝරන්න?

I. නිබ්බානං පරමං සුඛං
II. විස්වාසා පරමා ඥාති
III. සන්තුට්ඨි පරමං ධනං
IV. ආරෝග්‍යා පරමා ලාභා

18. තක්කඩි කම් කළොත් - දඬුවම් දෙති සැක නැත්
දඬුවම් නොදුන්නොත් - ළමයි කිසිකල හොඳින් නොහැදෙත් යන කවිය අයත් ග්‍රන්ථය

I. ලෝවැඩ සඟරාව යි
II. සිරිත් මල්දම යි
III. සුභාෂිතයයි
IV. ගුත්තිල කාව්‍ය යි

19. රන් බඳුනකට ආහාර ගෙන අනා කවමින් මමද එයින් අනුභව කළෙමි. සිරුර පිරිමදිමින් වැඩුවෙමි. අතපය ඒ මේ අත හරවමින් ඇඳුම් ඇන්දවීමි. යන පාඨයෙන් පැවසෙන ක්‍රියාවන් සිදුකරන ලද්දේ?

I. යශෝධරා දේවිය විසිනි
II. මහාමායා දේවිය විසිනි
III. කෝසල මල්ලිකා දේවිය විසිනි
IV. මහා ප්‍රජාපති දේවිය විසිනි

20. බුදුගුණ අතුරින් යථාවාදි තථාකාරි ගුණයෙන් අදහස් කරනුයේ.

I. කියන දේ නොකරන, නොකරන දේ කියන බවයි
II. කියන දේ කරන, කරන දේ නොකියන බවයි
III. කියන දේ කරන, කරන දේ කියන බවයි
IV. කියන දේ හෝ කරන දේ අනුමත නොකරන බවයි

කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය

# බුද්ධ ධර්මය

9 ශ්‍රේණිය

II කොටස

කාලය පැය:

* පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

01. දෙවන වාරයට නියමිත පාසල් පාදක ඇගයීම ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
   I. පාසල් පාදක ඇගයීම සඳහා පෙළපොතේ කුමන පාඩම යොදා ගත්තේද? එම ඇගයීම් ප්‍රභේදය කුමක් ද? (ල. 4)
   II. මෙම ඇගයීම සඳහා ගුරුභවතා ඔබහට දුන් උපදෙස් අතුරින් 2ක් ලියන්න. (ල. 4)
   III. මෙම කාර්ය සඳහා ඔබ විසින් රැගෙන ආවා වූ ද්‍රව්‍ය මොනවාද? (ල. 4)
   IV. මෙහිදී ඔබ විසින් සිදුකළ කාර්යයන් 4ක් ලියා දක්වන්න? (ල. 4)
   V. පූජා භූමියක හැසිරෙන විට ඔබ ආදර්ශවත් අයෙකු විය යුතුය. ආදර්ශවත් බව පෙන්වීමට ඔබ කළ ක්‍රියාවන් දෙකක් ලියන්න? (ල. 4)

02. I. බුදු දහමෙහි ඉගැන්වෙන ප්‍රධාන ඉගැන්වීම් අතුරින් 2ක් නම් කරන්න?
   II. " චේතනාහං භික්ඛවේ කම්මං වදාමි - චේතයිත්වා කම්මං කරොති කායේන වාචාය මනසා" යන්නෙහි තේරුම ලියන්න.
   III. කර්ම ඵල විශ්වාසය පුද්ගලයාගේ යහපත සලසන අයුරු පැහැදිලි කරන්න

03. I. අප කාහටත් කරදර විපත්වලට මුහුණ දීමට සිදුවේ. එවන් අවස්ථාවක දී අප කම්පානොවී ඒවාට මුහුණ දිය යුත්තේ කරුණු දෙකක් පදනම් කරගෙන ය. එම කරුණු දෙක නම් කරන්න?
   II. නාය යාමක් පිළිබඳව අපදා කළමනාකරණ මධ්‍යස්ථානය ඔබව දැනුවත් කළහොත් එයට මුහුණදීම සඳහා ඔබ අනුගමනය කරන ක්‍රියාමාර්ග 3ක් ලියන්න.
   III. ජල ගැලීමකින් පසුව උත්හිටි තැන් අහිමිව මහත් සේ විපතට පත් පිරිසක් වෙනුවෙන් ඔවුන් හට ඔබ පිහිට වන අයුරු ලියා දක්වන්න?

04. I. මහා ප්‍රජාපතී ගෝතමී තෙරණියගේ උදාර චරිතයෙන් ගතහැකි ආදර්ශ 2ක් නම් කරන්න?
   II. ඉන් එක් ආදර්ශයක් ඔබේ ජීවිතයට සම්බන්ධ කරගන්නා අයුරු කෙටියෙන් පහදන්න?
   III. මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය භික්ෂුනී ශාසනය ඇරඹීමෙහිලා කල කැප කිරීම පිළිබඳ විස්තර කරන්න?

05. I. සිව් බඹ විහරණ අතුරින් 2ක් නම් කරන්න?
   II. ඉන් එකන් කෙටියෙන් පහදන්න?
   III. සැනසුණු ජීවිතයක් ගත කිරීමට සිව් බඹ විහරණ උපකාරී වන අයුරු විස්තර කරන්න?

06. I. සදිසා නමස්කාරය හඳුන්වාදෙන බුද්ධ දේශනාව නම්කර ගිහි පැවිදි සබඳතාවය කිනම් දිසාවකින් දක්වන්නේ දැයි ලියන්න?
   II. භික්ෂූන් වහන්සේගෙන් ශාසනික වශයෙන් හා සමාජීය වශයෙන් සිදුවන සේවාවන් 3ක් ලියාදක්වන්න?
   III. ගිහි පැවිදි සම්බන්ධතාවය මැනවින් පවත්නා විට යහපත් සමාජයක් ගොඩනගාගත හැකිවන අයුරු පැහැදිලි කරන්න?

07. I. "සුඛකාමානි භූතානි යෝ දණ්ඩේන න හිංසති...." යන ධම්මපද ගාථාවේ ඉතිරි පද පේළිය සම්පූර්ණ කරන්න?
   II. එම ධම්මපද ගාථාවේ තේරුම ලියා දක්වන්න?
   III. "සත්ව හිංසනයෙන් වැළකීම උදාර ගුණයක් වේ" බුදුරජාණන් වහන්සේ සත්ව හිංසනය වැළැක්වීම සඳහා ඉදිරිපත් වූ අවස්ථාවක් පිළිබඳ නිදසුනක් ගෙනහැර දක්වමින් අපද සත්ව හිංසනයෙන් වැලකී සිටීමට කටයුතු කළයුත්තේ කෙසේ දැයි පැහැදිලි කරන්න?